පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

# තෙවන වාර පරීක්ෂණය - 2023

| ශ්‍රේණිය |
|---|
| 11 |

විෂයය :- නාට්‍ය හා රංගකලාව

පාසලේ නම : ..........................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය : පැය 03

- සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.
- පහත දැක්වෙන පද්‍ය කොටස් ඇසුරින් අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | |
|---|---|---|
| A - | හත් දවසක තව බෙහෙත් | කිරන්නේ |
| | පුරාම අවුරුදු දෙකක් | කිරන්නේ |
| | කිරා බරට ජයපාල ද | ගන්නේ |
| | ලෙඩාට ඉස්සර වෙදා | මැරෙන්නේ |

| | | |
|---|---|---|
| B - | නමින් පසිදු දඹදිව් තල පඩිපුර රජ කළ | නිරිඳුට |
| | යොදුන් ගණන් අඹ උයනක් විය එහි මැද සැදුණු | යසට |
| | ඇසින් බලා බැරි නිම වනු රන්කඳ වෙයි ගහේ | පාට |
| | ගොසින් පනිති එ අඹ ගහේ අඹයක පිළිසිඳ එම | විට |

| | | |
|---|---|---|
| C - | තුටන් කරන්නට දන | සැවොමා |
| | යස නැටුම් නටන්නට දනිමි | මෙමා |
| | රටින් නොමින් එන දන | සැවොමා |
| | අපෙ නැටුම් බලා යති වී | අරුමා |

| | | |
|---|---|---|
| D - | වැඩපල කළේ තැනුවේ අඹුවන් | එක්ක |
| | හැඩබල බලා තැළුවේ දාගෙන | ඔක්ක |
| | මඩගුලි ගෙනත් පෙරළා ඉඳගෙන | වක්ක |
| | බඩහැල මලේ අරගෙන පලයන් | බොක්ක |

| | | |
|---|---|---|
| E - | ආල වෙලා පියසේ | පටන් |
| | මම කෝල වැතුව සබයේ | මෙදැන් |
| | බාල මෙමගෙ වැරදි | නොගන් |
| | මෙම රාළහාමිලා හට | ආයුබෝවන් |

1. ගම්මඩු ශාන්ති කර්මයේ එන ගායනාංගයක් ඇතුළත් වන්නේ,
   1) A 2) B 3) C 4) D
2. "D" අක්ෂරයේ දැක්වෙන කවිය ඇතුළත් ශාන්ති කර්මය වන්නේ,
   1) කොහොඹා කංකාරිය 3) ගම්මඩුව
   2) දෙවොල් මඩුව 4) රටයකුම
3. නාඩගම් හි එන කවි ගායනයක් වන්නේ,
   1) C 2) D 3) E 4) A

4. සොකරි ජන නාටකයේ එන කවි ගායනයකි,

1) C　2) A　3) E　4) D

5. "E" අක්ෂරයේ දැක්වෙන කවිය ගායනා කරනු ලබන චරිතය වන්නේ,

1) නොංචි
2) දිත්තලා
3) ජසයා
4) ලෙංචිනා

- නිවැරදි පිළිතුර තෝරන්න.

6. නාට්‍ය පෙළක් ප්‍රබල වීමට අවශ්‍ය වන්නේ,

1. ප්‍රබල ගැටුම් අවස්ථාවක් තිබීමය.
2. රංග විධාන සහිත වීමය.
3. ප්‍රබල රංග වින්‍යාසයක් තිබීමය.
4. ගද්‍ය පද්‍ය මිශ්‍ර සංවාද ඇතුළත් වීමය.

7. නාට්‍ය අධ්‍යක්ෂකගේ කාර්යයක් වන්නේ,

1) චරිත සඳහා වේෂ භූෂණ නිර්මාණය කිරීම.
2) නාට්‍ය පිටපත සකස් කිරීමයි.
3) නාට්‍ය සඳහා මුදල් වියදම් කිරීමය.
4) නළු නිළියන් පුහුණු කරවීමයි.

8. වාචික අභිනය ප්‍රබල ලෙස යොදා ගනු ලබන ප්‍රාසාංගික කලාව වන්නේ,

1) මුද්‍රා නාට්‍ය ය　2) ඔපෙරා ය　3) බැලේ නාට්‍ය ය　4) ඉගිනළුව ය

9. ප්‍රාසාංගික කලාව යනු,

1) සංගීතය, නර්තනය, චිත්‍ර කලාවන්ගේ එකතුවෙන් බිහිවන දෘශ්‍ය කලාවකි.
2) නළු නිළියන් විසින් රූපවාහිනී මාධ්‍යයෙන් ඉදිරිපත් කරන නර්තන ප්‍රසංගයකි.
3) ප්‍රේක්ෂක පිරිසක් අභිමුඛයෙහි ඉදිරිපත් කෙරෙන සජීවී කලාවකි.
4) රූපවාහිනී වැඩසටහනක ඉදිරිපත් කරනු ලබන නර්තන ප්‍රසංගයකි.

10. නාට්‍යයක මූලික ලක්ෂණයක් වන්නේ,

1) රංග භූමි අලංකරණය සඳහා පසුතල යොදා ගැනීමය.
2) නර්තනය සමග සංගීතය භාවිතයට ගැනීමය.
3) මිනිස් ක්‍රියාවන් අනුකරණය කර දැක්වීමය.
4) ජීවමාන සංගීතය භාවිතයට ගැනීමය.

11. ගලායන එළිය යන අර්ථය ඇතිව පුළුල් කෝණයකින් ආලෝකය සපයමින් වේදිකා නාට්‍ය පසුබිම හා අවකාශය ආලෝකමත් කරනු ලබන පහන් වර්ගය වන්නේ,

1) ධාරාලෝක පහන.
2) යොමු පහන.
3) අල්ට්‍රා වයලට් පහන.
4) වර්ණ චක්‍රය.

12. කිට්සන් පහන් ආලෝකය භාවිතයට යොදා ගන්නේ,

1) බටහිර බැලේ නාට්‍ය සඳහාය.
2) නාඩගම් සඳහාය.
3) ගීත නාට්‍ය සඳහාය.
4) කෝලම් නාටක සඳහාය.

13. නාට්‍ය රචකයා විසින් ලියන ලද පිටපත සජීවී කලාවක් ලෙසට ප්‍රේක්ෂකයා වෙත ගෙනයාමට මූලික වන්නේ,

1) නාට්‍ය නිෂ්පාදකවරයා ය.
2) අර්ථපති ය.
3) රංගාලෝක ශිල්පියා ය.
4) නළු නිළියෝ ය.

14. නාට්‍යෝපකරණ යනු,

1) වේදිකා පසුතල නිර්මාණය.
2) නළු නිළියන් පළඳින මකුට වෙස් මුහුණු ආදියයි.
3) නළුවන් භාවිතා කරන යම් යම් භාණ්ඩය.
4) සැබෑ ද්‍රව්‍ය වලින් ම නිර්මාණය කරනු ලබන උපකරණය.

15. ප්‍රධාන අංග රචනා ප්‍රභේද දෙකකි.

1) සත්ත්ව අංග රචනය හා මිනිස් අංග රචනයයි.
2) ඍජු අංග රචනය හා චරිතාංග අංග රචනයයි.
3) චරිත අංග රචනය හා මුහුණේ අංග රචනයයි.
4) වේදිකා අංග රචනය හා රූපලාවන්‍ය අංග රචනයයි.

16. නාට්‍යයක ආනුෂංගික කලාවන් යොදා ගැනීමෙන් අපේක්ෂා කරන්නේ,

1) රංග භූමිය විචිත්‍රවත් කිරීමයි.
2) ආනුෂංගික ශිල්පීන් දිරිගැන්වීමයි.
3) නාට්‍යයකට අත්‍යාවශ්‍යයෙන් එම කලාවන් තිබිය යුතු වීමයි.
4) නළු නිළියන්ට රඟපෑම පහසු කිරීමයි.

17. අභිරූපණ රංගයක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය අංග දෙක කුමක්ද?,

1) ආංගික අභිනය සහ වාචික අභිනයයි.
2) සාත්වික අභිනය සහ රංග භූමි අංකරණයි.
3) ආංගික අභිනය සහ සාත්වික අභිනයයි.
4) අංග රචනය සහ නාට්‍යෝපකරණයි.

18. රංග වින්‍යාසය යනු වේදිකා අවකාශය තුළ නළු -නිළියන්,

1) රිද්මයානුකූලව චලනය කරවීමයි.
2) රංගනයේ යෙදවීමයි.
3) ස්ථානගත කරවන ආකාරයයි.
4) ගමන් කරවන ආකාරයයි.

19. සිරුර සම්බන්ධ සංවේදන අභ්‍යාස මගින්,

1) යමක් ආවර්ජනය කොට එය කුමක්දැයි පැවසිය හැකිය.
2) යමක් ස්පර්ශ කොට එය කුමක්දැයි අවබෝධ කරගත හැකිය.
3) යමක් ආඝ්‍රාණය කොට එය තිබෙන තැන හඳුනාගත හැකිය.
4) යමක් රස බලා එය කුමක්දැයි පැවසිය හැකිය.

20. පැති ගමන / දුෂ්කර ගමන / ආපසු ගමන අදාළ වන්නේ,

1) රංග අභ්‍යාසවලටය.
2) රංග ක්‍රීඩා වලටය.
3) අනුකරණයට ය.
4) අභිරූපණයට ය.

- පහත දැක්වෙන වගුව ඇසුරින් අංක 21 සිට 25 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| මුල් කෘතිය | රචකයා | අනුවර්තන/පරිවර්තන නාට්‍ය | අනුවර්තන/පරිවර්තන |
|---|---|---|---|
| ගුඩ් වුමන් ඔෆ් සෙට්සුවාන් | බර්ටෝල් බ්‍රෙෂ්ට් | A | සුගතපාල ද සිල්වා |
| වේටින් ෆෝ ගොඩෝ | සැමුවෙල් බෙකට් | ගොඩෝ එනතං | B |
| ද එල්ඩර් සන් | C | පුත්‍ර සමාගම | ප්‍රසන්න විතානගේ |
| D | හෙන්රික් ඉබ්සන් | බෝනික්කි ගෙදර | සුසිල් විජේසිරිවර්ධන |
| කොකේසියන් චෝක් සර්කල් | බර්ටෝල් බ්‍රෙෂ්ට් | හුණුවටයේ කතාව | E |

21. ඉහත වගුවේ A කොටුවට ඇතුළත් විය යුතු නාට්‍යයේ නම වන්නේ,

1) හරිම බඩු හයක්.
2) මඟුල් ප්‍රස්ථාව.
3) හිත හොඳ අම්මණ්ඩි.
4) අහස් මාලිගා.

22. ඉහත වගුවේ B කොටුවට ඇතුළත් විය යුතු පරිවර්තක වන්නේ ,

1) ජේ. ඒ. සෙල්වදොරේ.
2) පියදාස නිශ්ශංක.
3) බන්ධුල ජයවර්ධන.
4) උදය මල්ලවආරච්චි.

23. ඉහත වගුවේ C කොටුවට ඇතුළත් විය යුතු රචකයා වන්නේ ,

1) ලුයිජි පිරැන්ඩෙලෝ.
2) ප්ලෝටස්.
3) ඇන්ටන් චෙකොව්.
4) ඇලෙක්සැන්ඩර් වම්පිලෝව්.

24. ඉහත වගුවේ D කොටුවට ඇතුළත් විය යුතු මුල් කෘතිය වන්නේ,

1) යෙර්මා.
2) ඇපල් කාර්ට්.
3) ඩෝල්ස් හවුස්.
4) දෆාදර්.

25. ඉහත වගුවේ E කොටුවට ඇතුළත් විය යුතු පරිවර්තක වන්නේ ,

1) බන්ධුල ජයවර්ධන.
2) හෙන්රි ජයසේන.
3) රංජිත් ධර්මකීර්ති.
4) ප්‍රසන්න විතානගේ.

- පහත දැක්වෙන තොරතුරු ඇසුරින් අංක 26 සිට 30 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - මහා සම්මත රජු
B - පඬුවස්දෙව් රජු
C - සංඛපාල රජු
D - විෂ්ණු
E - රිද්දි බිසව්
F - සේරමාන් රජු
G - රාහු අසුරේන්ද්‍ර
H - අසූපාලි
I - මංගර දෙවි
J - දීපංකර බුදුන්

26. සන්නි යකුමේ උපත් කතාව හා සම්බන්ධ වන්නේ,

1) A සහ G ය.
2) C සහ H ය.
3) F සහ J ය.
4) E සහ I ය.

27. සුනියම් යාගයේ උපත් කතාව හා සම්බන්ධ වන්නේ,

1) A සහ D ය.
2) B සහ H ය.
3) H සහ I ය.
4) C සහ E ය.

28. කොහොඹ කංකාරියේ උපත් කතාව හා සම්බන්ධ වන්නේ,

1) E සහ F ය.
2) C සහ J ය.
3) D සහ C ය.
4) B සහ G ය.

29. මඩු ශාන්තිකර්මවල උපත් කතාව හා සම්බන්ධ වන්නේ,

1) C සහ G ය.
2) E සහ H ය.
3) F සහ I ය.
4) B සහ A ය.

30. රට යකුමේ උපත් කතාව හා සම්බන්ධ වන්නේ,

1) F සහ I ය.
2) E සහ J ය.
3) H සහ J ය.
4) C සහ I ය.

- පහත දැක්වෙන ඡායාරූප ඇසුරින් 31 සිට 35 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


F


G


H


I


J

31. ''මිනර්වා'' නාට්‍ය රූපණයේ ප්‍රකට වූ චරිතය ඇත්තේ කවර ඡායාරූපයේ ද?,
1) G ය. 2) J ය. 3) H ය. 4) F ය.

32. ''කැළණි පාලම'' නාට්‍යයේ ''රූපවතීගේ'' චරිතය රංගනයේ යෙදුනු ශිල්පිනිය දැක්වෙන අක්ෂරය වන්නේ,
1) J ය. 2) I ය. 3) F ය. 4) G ය.

33. ''විදී රැජිණ'' යන විරුදාවලිය ලබා ඇති රංගන ශිල්පිනිය දැක්වෙන අක්ෂරය වන්නේ,
1) I ය. 2) G ය. 3) F ය. 4) J ය.

34. ''H''අක්ෂරයෙන් දැක්වෙන රංගන ශිල්පිනිය රංගනයෙන් දායක වූ වේදිකා නාට්‍යයක් වන්නේ,
1) කපුවා කපෝති.
2) වරෙන්තු.
3) කැළණි පාලම.
4) තාරාවෝ ඉගිලෙති.

35. මෙහි ''G''අක්ෂරයෙන් දැක්වෙන රංගන ශිල්පිනිය වන්නේ,
1) රම්‍යා වනිගසේකර
2) මාලනි රණසිංහ.
3) සෝමලතා සුබසිංහ.
4) කෞෂල්‍යා ප්‍රනාන්දු

- පහත දැක්වෙන වෙස් මුහුණු දෙක ආශ්‍රයෙන් 36 සහ 37 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A




B

36. "A" සහ "B" වෙස් මුහුණු පිළිවෙලින්,
1) සන්නි මුහුණක් හා කෝලම් මුහුණකි.
2) කෝලම් මුහුණක් හා සන්නි මුහුණකි.
3) කෝලම් මුහුණු දෙකකි.
4) සන්නි මුහුණු දෙකකි.

37. මෙම වෙස් මුහුණු දෙක පැළඳි චරිත හා සම්බන්ධ ලක්ෂණයකි,
1) තැනින් තැනට ගොස් පණිවිඩ කීම.
2) ගමේ නීතිය හා සාමය ආරක්ෂා කිරීම.
3) ආරක්ෂාව සඳහා යුද්ධ කිරීම.
4) ගමේ රෙදි පිළි සේදීම.

38. කෙටි නාට්‍යයක් නිර්මාණය කිරීමේදී වඩාත්ම සැලකිලිමත් විය යුතු කරුණක් වන්නේ,
1) ගැඹුරු හා අපූරු සංක්ෂිප්ත ස්වභාවය.
2) රංග අවකාශය විසිරුණු ස්වභාවයක් ගැනීම.
3) අවස්ථා කිහිපයක් තුළ දිගහැරෙන කතාවක් විය යුතු වීම.
4) චරිත වැඩි ප්‍රමාණයක් යොදා ගැනීම.

39. නිර්මාණාත්මක රංග ක්‍රීඩාවලින් අපේක්ෂිත අරමුණක් නොවන්නේ,
1) අවධානය පවත්වා ගැනීම.
2) සාමූහික බව වර්ධනය.
3) ළයෙහි ධාරිතාව වැඩි කර ගැනීම.
4) ක්ෂණික තීරණ ගැනීමේ හැකියාව වර්ධනය කිරීම.

40. බෞද්ධ පූජා කර්ම පමණක් අඩංගු වරණය කුමක්ද?
1) දෙවොල් මඩුව, මිලින්ද ප්‍රශ්නය, ගම්මඩුව
2) රටයකුම, ගම්මඩුව, යුගාසන බණ
3) දොරකඩ අස්න, ආලවක දමනය, මිලින්ද ප්‍රශ්නය
4) ආලවක දමනය, දෙවොල් මඩුව, යුගාසන බණ

(ලකුණු 1 x 40 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(01) විකෘති නාට්‍ය පෙළ ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. විකෘති නාට්‍ය අයත් නාට්‍ය ශෛලීය කුමක්ද? (ලකුණු 02)
2. මෙම නාට්‍යයේ නාට්‍ය දෘෂ්ටිය කුමක්ද? (ලකුණු 02)
3. මෙහි එන ප්‍රියංගනිගේ පවුලේ සාමාජිකයින් නම් කරන්න. (ලකුණු 02)
4. මෙම නාට්‍යයේ දක්නට ලැබෙන බර්ටෝල් බ්‍රෙෂ්ට්ගේ රංග ශෛලිය හා සම්බන්ධ ලක්ෂණ දෙකක් නම් කරන්න. (ලකුණු 02)
5. මෙම නාට්‍යයේ යෞවන ප්‍රශ්න නියෝජනය කරන පිරිමි චරිත දෙකක් නම් කරන්න. (ලකුණු 02)
6. හිල්ඩා ප්‍රියංගනිගේ ඉගෙනුම වෙනත් මගකට හරවන්නේ ඇයි? (ලකුණු 02)

(02)

1. ප්‍රාසංගික කලාව යනු කමක් දැයි පැහැදිලි කරන්න. (ලකුණු 02)
2. නාට්‍යය හැර සෙසු ප්‍රාසංගික කලා තුනක් නම් කරන්න. (ලකුණු 04)
3. සෙසු ප්‍රාසංගික කලාවනට වඩා නාට්‍ය කලාවෙහි ඇති විශේෂත්වය පැහැදිලි කරන්න. (ලකුණු 06)

(03)

1. වේෂභූෂණ යනු කමක් දැයි පැහැදිලි කරන්න. (ලකුණ 02)
2. වේෂභූෂණ මගින් නාට්‍යයකට ලැබෙන ප්‍රයෝජන **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04)
3. වේෂභූෂණ නිර්මාණය කිරිමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු මොනවා දැයි විමසන්න. (ලකුණු 06)

(04)

1. කොහොඹා කංකාරිය ශාන්තිකර්මය පැවැත්වීමේ මූලික අරමුණු **දෙකක්** නම් කරන්න. (ලකුණු 02)
2. මෙම ශාන්තිකර්මයේ අතුරු රංග අවස්ථා **හතරක්** නම් කරන්න. (ලකුණු 04)
3. එයින් එක් රංග අවස්ථාවක නාට්‍යමය ලක්ෂණ උදාහරණ සහිතව පහදන්න. (ලකුණු 06)

(05)

1. පූර්වරංගය යනු කුමක් ද? (ලකුණු 02)
2. නාඩගම්වල පූර්වරංගයේ දී කරළියට පිවිසෙන චරිත **හතරක්** නම් කරන්න. (ලකුණු 04)
3. නාඩගම් රඟ දැක්වීමට ආවේණික වූ ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 06)

(06)



1. ඉහත රූපයේ දැක්වෙන නාට්‍යකරු නම් කරන්න. (ලකුණු 02)
2. ඔහුගේ පරිවර්තන හා ස්වතන්ත්‍ර නාට්‍ය දෙක බැගින් නම් කරන්න. (ලකුණු 04)
3. එතුමාගෙන් නාට්‍ය කලාවට සිදු වූ සේවාව අගයන්න. (ලකුණු 06)

(07) පහත දැක්වෙන කතා සැලකිල්ල ඇසුරින් ඔබ කැමති පරිදි නාට්‍ය පෙළක් නිර්මාණය කරන්න. ඔබට කැමති පරිදි චරිත සංඛ්‍යාව වෙනස් කර ගත හැකි ය.

''පාසලේ හත්වන කාලච්ඡේදයේදී රුවන් ඇතුළු පන්තියේ සිසුන්ට ගුරුතුමා ගණිතය පාඩමක් උගන්වමින් සිටී. එවිට රුවන්ගේ යහළුවකු වන අමල් පන්තියෙන් එළියේ සිට රුවන්ට අත වනා යම්කිසි පාර්සලයක් පෙන්වයි. මොහොතකින් රුවන් වැසිකිළියට යාමට ගුරුතුමාගෙන් අවසර ගෙන පන්තියෙන් එළියට පැමිණ අමල් හමු වී පාර්සලය දිග හරින්ම ............... ''

1. පසුබිම, කාලය හා චරිත මැවීමට අවශ්‍ය පරිදි රංග විධාන සමග සංවාද රචනා කිරීම සඳහා (ලකුණු 04)
2. චරිත අතර ගැටුමක් ඇති වන අයුරින් අවස්ථාව ගොඩ නැගීම සඳහා (ලකුණු 04)
3. නොසිතූ පෙරළියක් සහිත නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය කිරීම සඳහා (ලකුණු 04)